# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2019 අංක 3 දරන පරීක්ෂණ කොමිෂන් සභා (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2019 පෙබරවාරි මස 01 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2019 පෙබරවාරි මස 01 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකි ය.

**මිල :** රු. 8.00 **තැපැල් ගාස්තුව :** රු. 15.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# 2019 අංක 3 දරන පරීක්ෂණ කොමිෂන් සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2019 පෙබරවාරි මස 01 වන දින]

එල්.ඩී.—ඕ. 1/2018.

**(393 වන අධිකාරය වූ) පරීක්ෂණ කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2019 අංක 3 දරන පරීක්ෂණ කොමිෂන් සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) (393 වන අධිකාරය වූ) පරීක්ෂණ කොමිෂන් සභා පනත එහි 24 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලබන අතර, එම අලුත් වගන්ති ඒ පනතේ 24අ, 24ආ, 24ඇ, 24ඈ සහ 24ඉ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය:- 393 වන අධිකාරයට අලුතින් 24අ, 24ආ, 24ඇ, 24ඈ සහ 24ඉ වගන්ති ඇතුළත් කිරීම.

"අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් අපරාධ නඩු කටයුතු පැවරිය යුතු බව.

24අ. (1) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, 2 වන වගන්තිය යටතේ පත් කරන ලද පරීක්ෂණ කොමිෂන් සභාවක් විසින්, අවස්ථාවෝචිත පරිදි, පවත්වන ලද විමර්ශනයක දී හෝ පරීක්ෂණයක දී හෝ එම විමර්ශනය සහ පරීක්ෂණය යන දෙකේ දී ම හෝ රැස්කරන ලද කරුණු සලකා බැලීමේ දී පහත දැක්වෙන නීති යටතේ යම් වරදක් සිදු කර ඇති බවට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සෑහීමට පත්වන විට දී එය විසින් -

(අ) අල්ලස් පනත; හෝ

(ආ) වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත,

ප්‍රකාරව අපරාධ නඩු පවරන ලෙස අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත විධාන කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නඩු කටයුතු පැවරීමට පෙරාතුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් -

(අ) යම් වරදක් සිදු කිරීම පිළිබඳ වැඩිදුර විමර්ශන පවත්වනු ලැබිය හැකි ය;

(ආ) (1) වන උපවගන්තියේ සඳහන් තොරතුරු ලැබීමට පෙරාතුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් පවත්වන ලද විමර්ශනයක දී රැස්කරනු ලැබ තිබිය හැකි තොරතුරු සලකා බලනු ලැබිය හැකි ය; සහ

(ඇ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත වෙනත් යම් නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනයකින් ලැබ තිබිය හැකි තොරතුරු සලකා බලනු ලැබිය හැකි ය.

*අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින්, රැස්කරන ලද සහ ඒ වෙත ලැබී ඇති තොරතුරු අදාළ අධිකාරිය වෙත ඉදිරිපත් කළ හැකි බව.*

24ආ. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින්, උචිත යැයි සලකනු ලබන්නේ නම්, 24අ වගන්තිය යටතේ රැස්කරගත් සහ ලැබී ඇති තොරතුරු වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ යම් උචිත ක්‍රියාමාර්ගයක් ගැනීම සඳහා නීතිපතිවරයා වෙත හෝ වෙනත් යම් අධිකාරියක් වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

*ලබා දෙන ලද ප්‍රකාශ හෝ සාක්ෂි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් වාර්තාගත නොකළ යුතු බව.*

24ඇ. 2 වන වගන්තිය යටතේ පත් කරන ලද පරීක්ෂණ කොමිෂන් සභාවක් වෙත ප්‍රකාශයක් ලබා දී ඇත්තා වූ හෝ ඒ කොමිෂන් සභාව ඉදිරියෙහි සාක්ෂි ලබා දී ඇත්තා වූ යම් තැනැත්තකුගේ ප්‍රකාශයක් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින්, උචිත යැයි සලකනු ලබන්නේ නම් මිස, වාර්තා ගත කළ යුතු යැයි අවශ්‍ය කරනු නොලැබිය යුතු ය.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් නීතිපතිවරයාගෙන් උපදෙස් හෝ මත විමසිය හැකි බව.

24ඈ. 24අ, 24ආ හෝ 24ඇ වගන්තිවල විධිවිධාන බලාත්මක කිරීමේ දී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් නීතිපතිවරයාගෙන් හෝ නීතිපතිවරයා නියෝජනය කරන යම් නිලධරයකුගෙන් උපදෙස් හෝ මතය ඉල්ලා සිටීම, ලබා ගැනීම සහ සලකා බැලීම සිදු කරනු ලැබිය හැකි ය.

මේ පනතේ විධිවිධානවලින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ බලතල සහ කර්තව්‍ය පරිසීමා නොකළ යුතු බව.

24ඉ. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතින් හෝ වෙනත් යම් ලිඛිත නීතියකින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත පවරන ලද බලතල සහ කර්තව්‍ය මේ පනතේ විධිවිධානවලින් පරිසීමා නොකළ යුතු ය.''.

27 වන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 27 වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

''අර්ථ නිරූපණය.

27. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ -

"අල්ලස් පනත" යන්නෙන්, (26 වන අධිකාරය වූ) අල්ලස් පනත අදහස් වේ;

"අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත" යන්නෙන්, 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත අදහස් වේ;

"අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව" යන්නෙන්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද කොමිෂන් සභාව අදහස් වේ;

"වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත" යන්නෙන්, 1975 අංක 1 දරන ජාතික රාජ්‍ය සභාවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත අදහස් වේ;

"අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නෙන්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 16 වන වගන්තිය යටතේ පත් කරන ලද අල්ලස් සහ දූෂණ වැළැක්වීමේ අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ;

"නීතිය ක්‍රියාත්මක කිරීමේ අධිකාරිය" යන්නෙන්, යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ, යම් වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා බලය ලබා දී ඇති පොලිස් නිලධරයකු හෝ වෙනත් යම් තැනැත්තකු හෝ අධිකාරියක් අදහස් වේ.".

"අග්‍රාණ්ඩුකාරවරයාට" කර ඇති සඳහනක් "ජනාධිපතිවරයාට" කර ඇති සඳහනක් විය යුතු බව.

**4.** (1) ප්‍රධාන ප්‍රඥප්තියේ "අග්‍රාණ්ඩුකාරවරයා" යන වචනය වෙනුවට "ජනාධිපතිවරයා" යන වචනය ආදේශ කරනු ලැබිය යුතු ය.

(2) ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද යම් නියෝගයක, රීතියක, නියමයක, දැන්වීමක, නිවේදනයක, චක්‍රලේඛනයක, ගිවිසුමක, සන්නිවේදනයක හෝ වෙනත් ලේඛනයක, "අග්‍රාණ්ඩුකාරවරයා" ට කර ඇති සෑම සඳහනක් ම, "ජනාධිපතිවරයා" ට කර ඇති සඳහනක් වශයෙන් කියවා තේරුම් ගත යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**5.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.